# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2260/74 - 2021 දෙසැම්බර් මස 31 වැනි සිකුරාදා - 2021.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

5 වන සංශෝධනය

**ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2013 අප්‍රේල් මස 05 දිනැති අංක 1804/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසේ දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 දෙසැම්බර් මස 27 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01-2013 ජූලි මස 19 දිනැති හා අංක 1819/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධන අංක 02-2013 දෙසැම්බර් මස 20 දිනැති හා අංක 1841/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධන අංක 03-2018 ජනවාරි මස 12 දිතැනි හා අංක 2053/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*<br>
සංශෝධන අංක 04-2020 දෙසැම්බර් මස 02 දිනැති හා අංක 2204/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*


1A - G 35724-15 (2021/12)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**II කොටස**

පරිශිෂ්ඨය 01

**03. පරීක්ෂණ ක්‍රමය :**

"අ" කොටස :

| | | | |
|---|---|---|---|
| (i) | අවබෝධය | කාල පැය 1 1/2 | ලකුණු 100 |
| (ii) | බුද්ධි පරීක්ෂණය | කාලය පැය 1 1/2 | ලකුණු 100 |
| (iii) | සාමාන්‍ය දැනීම | කාලය පැය 01 | ලකුණු 100 |

**05. විෂය නිර්දේශය :**

**විෂය අංක 01 - අවබෝධය :**

අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කරගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මකබව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.

**විෂය අංක 02 - බුද්ධි පරීක්ෂණය :**

අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකතනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටළු විසඳීමේ හැකියාව, හේතුඵල සම්න්ධතා අවබෝධකර ගැනීම, පුරෝකතනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ.

**විෂය අංක 03 - සාමාන්‍ය දැනීම :**

ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික පරිසරය ඇතුලු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව දැනීම පිරික්සීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්නවලින් පමණක් යුක්ත වේ.
(පරිශිෂ්ඨය 01 හි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී)

EOG 12 - 0356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.